ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| දිනය | 2014 සැප්තැම්බර් මස 23 වැනි දින |

## මුදල් ප්‍රතිපත්ති විවරණය - 2014 සැප්තැම්බර්

2014 වසරේ පළමු කාර්තුව තුළ වාර්තා කළ සියයට 7.6 ක වර්ධනයට සාපේක්ෂව, වසරේ දෙවන කාර්තුව තුළ මූර්ත ද.දේ.නි.යෙහි සියයට 7.8 ක වර්ධනයක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකාවේ ආර්ථිකය තවදුරටත් ප්‍රසාරණය විය. දෙවන කාර්තුව තුළ ආර්ථික වර්ධනය සඳහා කාර්මික අංශයේ යහපත් ක්‍රියාකාරිත්වය මූලික වශයෙන් ඉවහල් වූ අතර, කෘෂිකාර්මික හා සේවා අංශ ද සමස්ත ආර්ථික වර්ධනයට දායකත්වය සැපයීය. 2014 පළමු අර්ධයේ වාර්තා කළ සියයට 7.7 ක වර්ධනය, වසරේ වර්ධන අපේක්ෂාවන් ළඟා කර ගැනීම සඳහා හිතකර ලෙස බලපානු ඇත.

ආර්ථිකයේ අඩු උද්ධමන තත්ත්වය තවදුරටත් පෙන්නුම් කරමින් 2014 අගෝස්තු මාසය තුළ දී වාර්ෂික ලක්ෂ්‍යමය පදනම මත මනිනු ලබන මතුපිට උද්ධමනය සියයට 3.5 ක් වූ අතර මූලික උද්ධමනය සියයට 3.9 ක් වාර්තා කළේය. වාර්ෂික සාමාන්‍ය පදනම මත මතුපිට උද්ධමනය සියයට 4.5 ක් වූ අතර මූලික උද්ධමනය සියයට 3.2 ක් විය. ඉදිරි කාලය පිළිබඳ සැලකීමේ දී, බලශක්ති හා ඛනිජ තෙල් පාලන මිල ගණන් පහළ දැමීමේ ධනාත්මක බලපෑම ඔක්තෝබර් මාසයේ මිල මට්ටම්වල පිළිබිඹු වෙතැයි අපේක්ෂා කෙරේ. ඒ අනුව, කලින් පුරෝකථනය කළ සියයට 4-5 පරාසයට සාපේක්ෂව වසර අවසාන වනවිට උද්ධමනය සියයට 3-4 පරාසයක පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

2014 ජූලි මාසය තුළ භාණ්ඩ හා සේවා අපනයන ඉපැයීම් හා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ඉහළ යෑම හේතුවෙන් විදේශීය අංශය යහපත් මට්ටමක පැවතුණි. ඛනිජ තෙල් ආනයන වියදම් ඉහළ යෑම හේතුවෙන් මාසය තුළ වෙළෙඳ හිඟය පුළුල් වුවද, 2014 වසරේ මුල් මාස 7 තුළ වෙළෙඳ හිඟය පෙර වසරේ අදාළ කාලසීමාවට සාපේක්ෂව අඩු විය. මෙම සංවර්ධනයන් සමගම, මූල්‍ය ගිණුමට නොකඩවා සිදු වූ ලැබීම් හේතුවෙන් වසරේ

මුල් මාස 7 තුළ ගෙවුම් ශේෂය ඇ.එ.ජ.ඩොලර් බිලියන 2 ක ඇස්තමේන්තුගත අතිරික්තයක් වාර්තා කළේය. මහ බැංකුව විසින් වසරේ මේ දක්වා, දේශීය විදේශ විනිමය වෙළෙඳපොළෙන් එ.ජ.ඩොලර් බිලියන 1 කට වඩා විදේශ විනිමය අවශෝෂණය කරගෙන ඇති අතර, දළ නිල සංචිත ප්‍රමාණය ආනයනික මාස 5.9 කට සමාන අගයක් ගනිමින් එ.ජ.ඩොලර් බිලියන 9 ඉක්මවා ගොස් ඇත. ඉහත කී විදේශ සංචිතවලට අමතරව, 2014 සැප්තැම්බර් 16 වන දින චීන රජයේ මහ බැංකුව සමග අත්සන් කළ ද්විපාර්ශ්වික විදේශ විනිමය හුවමාරු ගිවිසුම ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව චීන යුවාන් බිලියන 10 ක් (එ.ජ.ඩොලර් බිලියන 1.6 කට සමාන ප්‍රමාණයක්) සඳහා පහසුකම් ලබාගෙන ඇත. නැවත අලුත් කළ හැකි සහ කල් පිරීම වසර 3 ක් වන මෙම විදේශ විනිමය හුවමාරු පහසුකම මගින් ශ්‍රී ලංකා ආර්ථිකයෙහි විදේශීය ස්ථායීතාව තවදුරටත් ඉහළ යනු ඇතැයි අපේක්ෂා කෙරේ.

බැංකු අංශයේ ශුද්ධ විදේශීය වත්කම් අඛණ්ඩව ඉහළ ගිය ද, පුළුල් මුදල් සැපයුමේ ($M_{2b}$) වර්ධනය පෙර මාසයේ පැවති සියයට 13.3 සිට 2014 ජූලි මාසයේ දී සියයට 11.9 දක්වා අඩු විය. සමස්තයක් ලෙස, ජූලි මාසය තුළ දී රාජ්‍ය සංස්ථා විසින් බැංකු පද්ධතිය මගින් ලබාගෙන ඇති ණය නැවත ගෙවීම සිදු කළ අතර, බැංකු පද්ධතියෙන් රාජ්‍ය අංශයට ලබා දුන් ශුද්ධ ණය වර්ධනය විය. 2014 ජූලි මාසය තුළ දී වාණිජ බැංකු විසින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය අඩු මට්ටමක පැවතුණි.

අඛණ්ඩ මුදල් ප්‍රතිපත්ති ලිහිල්කරණය මධ්‍යයේ වුවද, බැංකු පද්ධතිය මගින් පෞද්ගලික අංශයට ලබා දුන් ණය අඩු මට්ටමක පවතින අතර, එහි ප්‍රතිඵලයක් ලෙස දේශීය මුදල් වෙළෙඳපොළ තුළ විශාල අතිරික්ත ද්‍රවශීලතාවයක් එක්රැස් වී ඇති බව මුදල් මණ්ඩලය පසුගිය මාස කිහිපය තුළ නිරීක්ෂණය කළේය. එම අතිරික්ත ද්‍රවශීලතාවය බැංකු පද්ධතිය තුළ සැලකිය යුතු කාල පරාසයක් භාවිතයට නොගෙන පවතිනු වෙනුවට, ඵලදායී ආර්ථික කටයුතු සඳහා උපයෝගී කර ගත යුතු බව මුදල් මණ්ඩලයේ අදහස විය. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍ය තැන්පතු පහසුකම සපයා ඇත්තේ විවට වෙළෙඳපොළ සහභාගිකරුවන්ට සිය අතිරික්ත ද්‍රවශීලතාවය අවශ්‍ය විටෙක තැන්පත් කිරීම මගින් තාවකාලික ද්‍රවශීලතා අතිරික්තයන් මඟහරවා ගැනීම සඳහා වුවද, බොහෝ වාණිජ බැංකු විසින් නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ දිගින් දිගටම අතිරික්ත අරමුදල් තැන්පත් කිරීම සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයේ අවධානය යොමු විය. මෙම පසුබිම තුළ, විශේෂයෙන්ම අඛණ්ඩව පවතින අඩු උද්ධමන තත්ත්වය සහ යහපත් උද්ධමන අපේක්ෂා සැලකිල්ලට ගනිමින් ඉහත තත්ත්වයන් සඳහා පිළියම් වශයෙන් සුදුසු මුදල් ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අවශ්‍ය බව මුදල් මණ්ඩලයේ අදහස විය.

ඒ අනුව, සැප්තැම්බර් 22 වැනි දින පවත්වන ලද මුදල් මණ්ඩල රැස්වීමේ දී විවට වෙළෙඳපොළ කටයුතු සඳහා සහභාගිවන්නන්ගේ ප්‍රවේශය සීමා කිරීම සඳහා සාමාන්‍යයෙන් භාවිතා වන වාර්ෂිකව සියයට 6.50 ක් යටතේ වූ නිත්‍ය තැන්පතු පහසුකම දිනදර්ශිත මසකට උපරිම අවස්ථා තුනක් දක්වා සීමා කිරීමට මුදල් මණ්ඩලය තීරණය කළේය. එමෙන්ම එම අවස්ථා තුන ඉක්මවා නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කිරීමේ දී අදාළ වන පොලී අනුපාතිකය

වාර්ෂිකව සියයට 5.00 ක් වනු ඇතැයි ද මුදල් මණ්ඩල රැස්වීමේ දී තීරණය කරන ලදී. මෙම ක්‍රියාමාර්ගය නැවත දැනුම් දෙන තුරු 2014 සැප්තැම්බර් මස 23 දින සිට බලපැවැත්වේ. 2014 සැප්තැම්බර් මස ඉතිරි කාල පරිච්ඡේදය සඳහා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) හරහා විවට වෙළෙඳපොළ කටයුතු සඳහා ප්‍රවේශවීම අවස්ථා දෙකකට පමණක් සීමා කර ඇත. මීට අමතරව, 2014 සැප්තැම්බර් මස 23 වන දින සිට නැවත දැනුම් දෙන තෙක් දෛනික වෙන්දේසි පහසුකම අත්හිටුවනු ලබනු ඇත. එමෙන්ම නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) වාර්ෂිකව සියයට 8.00 ක් ලෙස නොවෙනස්ව පවතී.

ඉහත ක්‍රියාමාර්ග හේතුවෙන් අතිරේක ද්‍රවශීලතාව ප්‍රමාණවත් පරිදි උපයෝජනය කර වඩාත් සාධාරණ පොලී අනුපාතික යටතේ පෞද්ගලික අංශය සඳහා ලබා දෙන ණය ඉහළ නැංවීම උදෙසා වාණිජ බැංකු පෙළඹවීම සහ ඒ හරහා අඩු උද්ධමන වාතාවරණය මධ්‍යයේ ආර්ථිකයේ වර්ධන ප්‍රවණතාව සඳහා අනුබලයක් සැපයීම මුදල් මණ්ඩලයේ අභිප්‍රාය වේ.

| **මුදල් ප්‍රතිපත්ති තීරණය: නිත්‍ය තැන්පතු පහසුකම සඳහා ප්‍රවේශ වන වාර ගණන සීමා කෙරේ.** | | |
|---|---|---|
| **කාල පරිච්ඡේදය** | **අවස්ථා ගණන** | **අදාළ වන අනුපාතිකය** |
| 2014 සැප්තැම්බර් මස 23 සිට 30 දක්වා | 2 | 6.50% |
| | 2 ට වැඩි | 5.00% |
| 2014 ඔක්තෝබර් මස 1 සිට දිනදර්ශිත මාස සඳහා | 3 | 6.50% |
| | 3 ට වැඩි | 5.00% |

මීළඟට නියමිත මුදල් ප්‍රතිපත්ති ප්‍රකාශය නිකුත් කරනු ලබන දිනය යථා කාලයේ දී ප්‍රකාශයට පත් කරනු ඇත.